# 2021 ජුලි මස 20 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ 2021 ජුලි මස මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.උජිත් ක්‍රිශාන්ත කල්දේරා මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනී ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |

| | | | |
|---|---|---|---|
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | මෙරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩි.තාරක මුණසිංහ මහතා විසින් 2021.07.20 වන දින මාසික සභා රැස්වීමේ කැදවීම් නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.</u>

2021.06.30 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඒල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,2021.06.30 දින සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු යයි මා යෝජනා කර සිටිනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී -ඩබ්.ශ්‍රියානි හේමලතා මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, 11 වන පිටුවේ අංක 5(1) දරන යෝජනාවට පක්ෂව කිසිදු මහා නගර සභා මන්ත්‍රීවරයකු ඡන්දය ප්‍රකාශ නොකරන ලදි. මම කාරුනිකව සභාවෙන් ඉල්ලා සිටිනවා වාර්තාවෙන් මේ වගන්තිය ඉවත් කරන ලෙස .

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය වරද පෙන්වා දෙන්න.

**<u>මහ නගර සභා මන්ත්‍රී -ඩබ්.ශ්‍රියානි හේමලතා මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒහෙම දෙයක් සිදුවුනේ නැති නිසා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, ඇයි නැත්තේ.

**<u>මහ නගර සභා මන්ත්‍රී -ඩබ්.ශ්‍රියානි හේමලතා මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, ප්‍රකාශ නොකර සිටියේ නැහැනේ. ඒතනදි ඒ යෝජනාවට ඒකඟවයි තර්ක කර කර හිටියේ.නමුත් සභාව විසින් මෙහෙයවුයේ විරුද්ධව ඡන්දයක් දිම සදහා ඒකඟවෙන්න කියලා ඒගොල්ලන්ගෙන් ඇහුවේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, බෙදිම ගැන විතරයි ඔතන තියෙන්නේ.

**<u>මහ නගර සභා මන්ත්‍රී -ඩබ්.ශ්‍රියානි හේමලතා මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි,මෙතන කියනවා යෝජනාවට විරුද්ධව පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ජන්දට ප්‍රකාශ කරන ලදි.නමුත් අපි බෙදිමක් සිද්ධ කරන්න කිව්වේ නැහැනේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, සභාවේ විවාදයක් උනාම ඕනෑම දෙයක බෙදිමක් කල යුතුයි. බෙදිමක් නොකරන්න නම් විවාදයක් නොකර ඉන්න ඕන.

**<u>මහ නගර සභා මන්ත්‍රී -ඩබ්.ශ්‍රියානි හේමලතා මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, සඳහන් වෙන්න ඕන යෝජනාවට පක්ෂව නොවෙයිනේ.බෙදීමක් ඉල්ලිම සඳහා විරුද්ධ වුනා කියන එකනේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, ඒ අවස්ථාවේ මම පැහැදිලිවම කියනවා යෝජනාවක් සභාවට ඇතුලත් කලාට පසු ඒකට විවාදයක් ගියාට පසුව ඒ බෙදිම අපි ලබාදිය යුතුයි ඔබතුමියල පුන පුනාම කිවුවා බෙදිම ඕනෑ කියලා.ඊට පසුව අවසාන මොහොතේ කියනකොට නැහැ අපි යෝජනාව ඉදිරිපත් කරන්නේ නැහැ කියලා බෙදිම අරගෙන ජන්ද විමසිම කරලා ඉවරයි. ඒතකොට ඔබතුමියට මුකුත් කරන්න කාලයක් තිබුනේ නැහැ.ඒක තමයි ඇත්ත. ඔබතුමියගේ මන්ත්‍රී කණ්ඩායම එකතු වෙලා ගන්න ඕන තීත්දුව සභාව ඇතුලේ ගන්න බැහැ.සභාව ඇතුලේ ගන්න පුලුවන් නම් අපිට ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායම් තියන්න ඕනත් නැහැ. ඔබතුමියලගේ කණ්ඩායම් රැස්විම් තියන්න ඕනත් නැහැ.ඒක ඒ අවස්ථාවේ කර ගන්න ඕන දෙයක් සභාව තුලට ඇවිල්ලා මෙතන සභාවල් කීපයක් තියන්න බැහැනේ. මේක ඒක සභාවක්. ඒ තීන්දුව ගැනිමට ඔබතුමියලා ප්‍රමාද වුන නිසා බෙදිමක් කලා ඒතකොට ඔබතුමියලා ජන්දය දිමෙන් වැලකී සිටියා. හා කිව්වෙත් නැහැ ඕන කිව්වෙත් නැහැ.

**<u>මහ නගර සභා මන්ත්‍රී -ඩබ්.ශ්‍රියානි හේමලතා මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, අන්න හරි ඒක තමයි වුනේ. ඊලඟ සංශෝධනය මම ප්‍රකාශ කලා දෙතුන් වතාවක්ම මම හතලිස් දෙදෙනෙක්ගේ කැමැත්ත අනුවයි මේ යෝජනාව ගෙනාවේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, සභා වාර්තාවේ තිබෙන සංශෝධනයක් තියෙනවා නම් ඔබතුමිය ඉදිරිපත් කරන්න. ඔබතුමියට දැන් ඔය සම්බන්ධයෙන් කථා කරන්න බැහැ.දැන් සංශෝධන බැහැ නැවත මාස 06 ක් යනකම් ගෙන්න බැහැ.

**<u>මහ නගර සභා මන්ත්‍රී -ඩබ්.ශ්‍රියානි හේමලතා මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි,ගේන්න නොවෙයි මම කියන්නේ මම ප්‍රකාශ කරපු දෙයක් මෙතන සටහන් කරලා නැහැ කියන ඒක.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය,කියපු නැති ඒක කියන්නකෝ.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,මම යෝජනා කලා හතලිස් දෙකක ඒකක් ගෙනාවම මේගොල්ලෝ විරුද්ධ වුනාම ඒහෙම නම් විරුද්ධත්වය ප්‍රකාශ කරලා ලිඛිතව අපිට දෙන්න කවුද විරුද්ධ කියලා.ඒක මෙතන සටහන් කරලා නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය,ඔබතුමියට විරුද්ධ වුන අවශ්‍ය නැහැ සභාවට ආවට පස්සේ සභාවේ විරුද්ධ තාවය විතරයි මම බලන්නේ. කවුද විරුද්ධ වුනේ කවුද යෝජනාව දැම්මේ කියන ඒකත් මම හොයන්නේ නැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී -ඩබ්.ශ්‍රියානි හේමලතා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට මම කිව්වේ මෙතන මම කියපු ඒවා සටහන් වෙලා නැහැ කියන ඒක විතරයි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, සටහන් නොකරන කරුණු සභා වාර්තාවට ඇතුලත් කරන්නේ නැහැ. අපේ තියෙනවා සභාවක් කරගෙන යන වැඩ පිලිවෙලක්. සභාවේ වාර්තාවට ඇතුලත් කරන්න පුලුවන් ඒවා හැර හැම ඒකක්ම ඇතුලත් කරන්න බැහැ.ඒතකොට සභාවක් වෙන්නේ නැහැනේ.

2021.06.30 දිනැති වාර්තාව මහා නගර සභා මන්ත්‍රී එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව 2021.06.30 දින පැවති මහ සභා වාර්තාව සභා සම්මත විය.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන</u>

**2(1)** <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි,ජනතා විමුක්ති පෙරමුණ මන්ත්‍රී කණ්ඩායම් නායක මහා නගර සභා මන්ත්‍රී කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා අසනීප තත්වයෙන් පසුවන බැවින් සභාවට නොපැමිනෙන බව දන්වා ඒවා තියෙනවා.

**2(2)** <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මහා නගර සභා මන්ත්‍රී පී. පිලිප් ගාවින් මත්තෙස් මහතා අසනීප තත්වයෙන් පසුවන බැවින් සභාවට නොපැමිණෙන බව දන්වා තියෙනවා.

**2(3)** **<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, මහ නගර සභා මන්ත්‍රී ඩී.ඒම්.සුජිත් පුෂ්ප කුමාර මහතා අසනීප තත්වයෙන් පසුවන බැවින් සභාවට නොපැමිණෙන බව දන්වා තියෙනවා.

**2(4)** **<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, සැලසුම් කල දිනයන්හි සභාව පවත්වා ගනිමින් ඒවගේම සියලුම මන්ත්‍රිවරුනුත් මාධ්‍යවේදින් සියලුම දෙනාට ආරාධනය කරමින් ඊළඟ සභාවේ සිට කටයුතු කරන ලෙස දන්වා සිටිනවා.

ගරු මන්ත්‍රිවරුනි, 2021.07.26 දින 9.30 සෞඛ්‍ය කමිටුත්, 2021.07.26 දින 10.30 ආයතන කමිටුවත්, 2021.07.26 දින 1.30 කර්මාන්ත කමිටුව සහ 2021.07.26 දින 2.00ට මුදල් කමිටුව පවත්වන බව දන්වා සිටිනවා.

## 03. <u>සභාව අමතා ඒවන ලද ආයාචනා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.</u>

**03(1)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ආයචනා පෙත්සම් යටතේ කරුණු කීපයක් තියෙනවා ඉදිරිපත් කරන්න.මේ සභා වාරයේදි අපි බලාපොරොත්තු වුනා මාධ්‍යවේදින්ට අවස්ථාව ලැබෙයි කියලා නමුත් ඒ අවස්ථාව මේ වාරයේදිත් මඟහැරි තියෙනවා අපි ඒ පිලිබඳ අපේ විරෝධයත් කණගාටුවත් ප්‍රකාශ කරනවා. සියල්ල කොවිඩ් මත පදනම් කරගෙන සභාවේ මධ්‍යවේදින්ටත් මේ අවස්ථාව ලබා දිය යුතුයි. ජනතාව මේ කරුණු දැනගත යුතු නිසා මාධ්‍යවේදින්ට අවස්ථාව ලබා දෙන ලෙස අපි ඉල්ලා සිටිනවා.

**03(2)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, සොයිසා පුර නිලන්ත ප්‍රනාන්දු මහතා සහ කපිල හෙට්ටිආරච්චි F4 සහ F 8 නිවාස යෝජනාක්‍රම වල සිටින ඒ මහතුන් දෙපල ඇතුලු ප්‍රදේශ වාසින්ගේ ඉල්ලීමක් සොයිසා පුර ක්‍රිඩා පිටිය ලෙදර්බෝල් ක්‍රිඩා කිරිම සම්බන්ධයෙන් පැන නැගි ඇති ගැටලුව සම්බන්ධයෙන් ඔවුන් ඒකඟතාවයක් නැහැඔවුන් ඉල්ලිමක් කරනවා ලෙදර් බෝල ක්‍රිඩා කිරිමට හැකි වටපිටාවක් නැහැ ඒ ක්‍රිඩාංගනයේ සයිට් විකට් ඒක ගැන නොවෙයි මේ කියන්නේ පොදුවේ ක්‍රිඩා කරන ස්ථානයක් නිසා ඒය නොකරන ලෙසත් දරුවන්ට පොදුවේ ක්‍රිඩා කරන්න සුදුසු පරිදි සකස් කරන්න කියලා ඉල්ලිමක් තියෙනවා.

**03(3)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේ වෙලාවේ සොයිසා පුර S යෝජනා ක්‍රමයේ යම් අවදානම් තත්වයක් මතුවෙලා තියෙනවා කොවිඩ් ආසාදිතයින් කීපදෙනෙක් සහ නිවාස 8 කට ආසන්න ප්‍රමාණයක් නිරෝධානයට ලක් කරලා තියෙනවා ඒ අයගේ කසල ප්‍රශ්ණයට ගැටලුවක් පැන නැගි තියෙනවා ඒ අයගේ කසල ඒකතු කිරිමේ දි ඔබතුමා කාරුණිකව මැදිහත් වෙලා ඒ අයගේ කසල ලබා ගැනිම වෙන්වෙන් යම් ක්‍රම වේදයක් සකස් කර දෙන්න කියල ඉල්ලිමක් කරනවා.

**03(4)** <u>**මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ ඉන්දිජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මේ අවස්ථාවේදී මම විශේෂ ස්තුතියක් කරනවා සුරංග අපොන්සු ගරු මන්ත්‍රීතුමාට ඒතුමාට වෙන්වුනු ප්‍රතිපාදන යටතේ අගුලාන පොදුජය මාවතේ කෙලවරේ දීර්ග කාලයක සිට ඒ ජනතාව ඉල්ලීමක් කරා ජලය බැසයාම සඳහා කාණු පද්ධතියක් සකස් කරලා දෙන්න කියලා එතුමා මැදිහත් වෙලා ඒම කටයුත්ත නිමකිරිම වෙනුවෙන් ප්‍රදේශවාසින් සහ යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයෙක් වශයෙන් සහ ඔබතුමාටද ස්තුතිවන්ත වෙනවා.

**03(5)** <u>**මහ නගර සභා මන්ත්‍රී - ඒම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා, මට ඔබතුමාගෙන් ආයාචනා පෙත්සම් යටතේ මගේ මන්ත්‍රී දීමනාව සම්බන්ධයෙන් දැන ගන්න තියෙනවා. මගේ මන්ත්‍රී දිමනාව දෙන්න එපා කියලා පක්ෂයේ මහ ලේකම්තුමා ඔබතුමාට දැනුම් දිමක් දුන්නද කියලා මට දැනගන්න කැමතියි.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය,මෙය ආයාචනා පෙත්සම් යටතේ දැන ගැනිමට කැමතියි කිව්වට මට උත්තර දෙන්න පුලුවන් කමක් නැහැ මේ වෙලාවේ. මන්ත්‍රීරුන්ගේ තියෙන නොදැනුවත්කම නිසා මම මෙයට උත්තරයක් දෙනවා මොකද දැනුවත්වීමක් සිදුවන නිසා සභාවේ මේ වෙනකොට මේ ණය මුදල ලබා දිම සම්බන්ධයෙන් විගණනයක් සිදු වෙනවා. නමුත් අපි නිශ්චිත වෙන්නාවූ යම් කිසි මුදල් ප්‍රමාණයක් අය කර ගැනිම නිසා ඒකට යම් වටිනාකමක් තියෙන වැඩක් කරපු නිසා ඒක විගණන විමසුමක තත්වයක් තිබුනත් ඒක පහව යන විදියට කටයුතු කර ගන්නට පුලුවන් කම තියෙනවා. නමුත් මම ඇතුලු මන්ත්‍රීවරුගේ ඉල්ලීම මත මෙම ණය මුදල ලබා දිමේදී සම්පුර්ණයෙන්ම පහත සඳහන් අය මේ සඳහා තමන්ගේ කැමැත්තවත් දිලා නැහැ. ඒ නිසා ඒ අය හෙට අනිද්දා මොකක් හෝ විගණනයක් ආවොත් විගණනයෙන් නිදහස්. මේ වෙනකොට අධිහාරයක් ඇවිල්ලා තියෙනවා මම ඇතුලු මන්ත්‍රීවරු කීප දෙනෙකුට භාරලක්ෂ හැත්තෑනමදාහක් ඒක්අයෙකුට ගෙවන්න අධිහාරයක් ඇවිල්ලා තියෙනවා අපිට. අධිහාරයත් පස්සෙන් ඒනවා අපි දන්නේ නැහැ. වර්ථමානයේ පවතින්නාවූ දේශපාලන වාතාවරණය තුල අපිට ඒ තින්දුව ගන්න වුනා. මහ නගර සභා මන්ත්‍රී යු.ඒල්.සේනක දමයන්ත සිල්වා, පී.ගාවින් මත්තෙස්, සුනිල් නන්දසිරි, රවිනාත් ජේ ගුණසේකර, සජිත් දුමින්ද පිරිස්, යු.අනුරසිරි පිරිස්, ආර් ඒම්. දෝන දිලාශිනී, ප්‍රසන්න මනෝජ් ,ජී.ඒන්.නිරෝෂන් , ජී.සුරංග අපොන්සු, සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ, මේරියන් ලිහිනි ප්‍රනාන්දු, සිත්ති මසිනි බක්කර්, ඒම්.ශිරෝමි ඉන්දිකා කුරේ, ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු, ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු, රන්දු නිරෝෂන යන මහත්ම/මහත්මින් මේකට ජන්දය දිලත් නැහැ. මේ ජන්ද විමසිම කරන වෙලාවේ සභාවේ නොසිට හෝ ජන්දය පාවිච්චි කරලත් නැහැ.ඊට අමතරව දැන් ඉහල අධිකරණයේ ශ්‍රේෂ්ඨාධිකරණයට නියෝගයක් දිලා තියෙනවා එක්සත් ජාතික පක්ෂයෙන් තරඟ කරපු අය ඔවුන්ගේ ධුරධාරිත්වය නැති කරනවා කියලා. ඒ නියෝගයක් මේ වෙනකොට දිලා ඉවරයි. මේ වෙනකොට ධුරධාරිත්වය නැති කරලත් තියෙනවා. ඒ නිසා ලේකම්තුමා විසින් ඔබගේ කණ්ඩායමේ නායකයෙක් විදියට කෙනෙක්ව පිලිගත්තම ලේකම්ගේ ලිපිය පිලිගන්නෙත් නැහැ කියලා අභියෝගයට ලක් කරල දිපු ලිපියකුත් අපි සන්තකයේ තියෙනවා. හෙට අනිද්දා ඔබව අයින් කලොත් ඔබගෙන් අය කරගන්න තියෙන මුදල අය කර ගන්න වෙන්නේ ණය මුදල ලබාදීමේදී ජන්දය දිපු අපෙන් මිසක් ඔබෙන් නොවෙයි. ඒ නිසා අයකර ගැනිමේ කටයුත්ත අනිවාර්යයෙන්ම සභාව කල යුතු වෙනවා. මන්ත්‍රීධුර අයින් කරනවාද නැද්ද විනය පරික්ෂණයක් තියෙනවද මැතිවරණ කොමසාරිස් පනතින් බලය දිලා තියෙන්නේ ලේකම්තුමාට නිසා ගරු පක්ෂ ලේකම්තුමා අපිට ඒවනවා නම් ඔවුන්ට විනය පරිකෂන තියන්නේ නැහැ මන්ත්‍රීධුර අත් හිටවන්නේ නැහැ කියලා කැපිම නවත්වන්න පුලුවන් ඊට වඩා නීතිමය තත්වයක් නැහැ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, විනය පරික්ෂණයක් තියෙනවා කියලා මහ ලේකම්තුමා ඒදා ඒවුවානේ ඔබතුමාට ලිපියක් ඔබතුමා ඒක පිලිගත්තානේ.ඒතකොට මම ඒක්සත් ජාතික පක්ෂයෙන් පිට කිසිම දේකට සම්බන්ධ වෙලා නැහැ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමිය, අපිට ඒක අදාල නැහැ.මම ඔබතුමියට තේරුම් කිරිමක් විතරයි කලේ. ඔබතුමිට කථාකරන්න වෙලාවක් නොවෙයි මේ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා,මට විනය පරික්ෂණයක් තීයෙනවා කියලයි ඔබතුමා මගේ මන්ත්‍රිවරප්‍රසාද නැති කලේ. ඒතකොට මම සම්බන්ධව පක්ෂයේ මහ ලේකම්තුමා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමතියි ඔබතුමාට ලිපියක් ඒව්වද මට මන්ත්‍රි වැටුප දෙන්න ඒපා කියලා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමිය,මට එවා ඔබතුමියට කිය කිය ඉන්න ඕන නැහැ.මෙතනින් ඒහාට මේක කථා කරන්න බැහැ මම ඊලඟ අයිතමයට යනවා හේතුව ඔබතුමියගේ ලේකම්තුමා දිපු නියෝගයක් පිලිගන්න නැහැ කියලා අත්සනක් මා සන්තකයේ තියෙනවා. මට කරන්න තියෙන්නේ ඒකම දේ මෙපමනයි. ඔබතුමිය ලේකම්තුමාගෙන් ලිපියක් ගේනතුරු උත්තරයක් මා සන්තකයේ නැත.

**03(6)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඒච්.ප්‍රදිප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ප්‍රථමයෙන්ම අපේ සුදේශ් ඉන්ද්‍රිජිත් මන්ත්‍රිතුමා මතු කරපු කාරණය දැන් සියල්ල සාමාන්‍ය පරිදි සිදු කෙරෙන නිසා ගරු නගරාධිපතිතුමනි මහ සභා රැස්විම ප්‍රාදේශිය මාධ්‍යවේදින්ට වත් ඒ අවස්ථාව ඊලඟ සභාවාරයේදි ලබා දෙන්න කියලා ඉල්ලිමක් කරනවා.

**03(7)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඒච්.ප්‍රදිප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මීට දින හයකට පමණ උඩදි කොරළවැල්ල කටුකුරුන්ද ජෝෂප් පෙදෙස මාර්ගය ඔබතුමාගෙන් කරන ලද ඉල්ලිමට ප්‍රතිචාරයක් විදියට ඒ පාර පිලිසකර කලා. හැබැයි එදා සිට අද වෙනතුරු ඒ මාර්ගයේ දිලා තිබෙන ගල් වැලි ආදිය ඉවත් කරලා නැහැ.වාහන යන්න විදියක් නැහැ විශාල විදියට මේ ප්‍රශ්ණය මතුවෙලා ඉරිදා දවසේ ඒ මිනිස්සු මාව සොයාගෙන ආවා. මම පාරට ගිහිල්ලා දැනුවත් කරලා කොහොම හරි මේක ඉවත් කරනවා කියලා මම පොරොන්දු වුනා.මම TSA තුමියට කථා කලා ඒතුමියත් ලොකු උත්සහයක් ගත්තා මේ වැඩේ කරන්න. හැබැයි මේ මොහොත වෙනකනුත් ඉටු වුනේ නැහැ. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙය අද දවසේ ඉවත් කරන ඒක විතරක් නොවෙයි නිලධාරියෙක් යම් දෙයක් පහල නිලධාරියකුට කිව්වම ඒක ඉටු වෙන්නේ නැත්නම් සභාවේ යම් ක්‍රියාමාර්ගයක් තියෙන්න ඕන එය ඉටු වෙන්නේ නැත්නම් ඊළඟ ක්‍රියාමාර්ග තියෙන්න ඕන.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, ඊලඟ පාර ඔය කටයුතු කරද්දි නිකම්ම නිකන් කථා කරන්න ඒපා අදාල වෙන්නාවු පරිපාලකත් ඒක්ක කථා කරලා ලියුම ලියලා දාලා අපිටත් කොපියක් ඒවන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ පැත්තේ දැන් බිහිවෙලා ඉන්නවා ජංගම දුරකථන අරගෙන පොඩි කුණු ගොඩක් දැක්කත් ෆොටෝ ගහල සමාජ මාධ්‍යයේ දාලා විකාර කරන අය. ඒනිසා ඒගොල්ලෝ මතුවෙන්න හේතු බවට පත් වෙනවා මේවා. ඒ නිසා ඒහෙම නොකර අපේ කාර්යභාරය හරියට කරමු.

**03(8)** <u>නියෝජ්‍ය නගරාධිපති - ඞී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, පලමුව සුහම සුභ උපන්දිනයක් වගේම දීර්ඝායු කියා ප්‍රාර්ථනා කරනවා මහ නගර සභා මන්ත්‍රී කුමාර රාජරත්න මහතාට. මොරටුව මොරටුවැල්ල වශයෙන් ගත්තොත් ඒකෙත් බෙදල ගත්තොත් මගේ කොට්ඨශය තුල මම මීට පෙරත් මේ සභාවේ මේ ගැන සඳහන් කලා කාණු පවිත්‍ර කිරිම සම්බන්ධයෙන් ඉතාම කණගාටුදායක තත්වයත් තමයි තියෙන්නේ ගරු නගරාධිපතිතුනි. ඔබතුමා දන්නවා අපිට සතියකට වරක් කාණු කණ්ඩායම හය දෙනෙක් කොට්ඨාශයට යොමු කරනවා. තණකොළ කපන කෙනත් සමහ සමහර අවස්ථාවල මේ හය දෙනා තුන් දෙනා හතර දෙනා වෙනවා. ශුද්ධ කරන්න කාණු 10 ක් පමණ මගේ කොට්ඨාශය තුල තිබෙනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා සමාවෙන්න, ගරු කොමසාරිතුමාට රුස්විමක් තියෙනවා මමත් ඒතන ඉන්න ඕන. මම එතුමාව ඒ රැස්වීමට යවනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඞී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ කාණු 10 ශුද්ධ කරනකොට ඇත්තටම නගරාධිපතිතුමා ඉදිබැද්ද, මොරටුමුල්ල,විල්ලෝරාවත්ත ප්‍රදේශ ගත්තොත් සමහර විට මේ කාණුවල වතුර රැදෙන ප්‍රවණතාවය අඩුයි වතුර බැහැලා යනවා කඳු පල්ල්ම තියෙන නිසා. මේ පැති මුහුදට කිට්ටුව තියෙන නිසා තැනිතලා භුමිනිසා කාණුවල ජලය ක්‍රමාණුකුලව බහින්නේ නැහැ. ඒම නිසා ඩෙංගු මදුරුවෝ බෝවෙලා. එහෙත් කාණු කණ්ඩායම ඒක දවසක් ආවාම කාණු බාගෙට කරන්නේ ඊලඟට සති 10 කින් ඊලඟ කාණුවට ඒනකොට ඔබතුමා ප්‍රායෝගිකව කල්පනා කරලා බලන්න ඒ කාණුව තවත් පල්වෙනවා. ඒම නිසා ගරු නගරාධිපතිතුමනි, මොනව හරි ක්‍රමවේදයක් කරන්න ජනතාව ඇත්තටම කලකිරිලා තියෙන්නේ. අපිට ගමේ යන්න බැරි තත්වයක් තියෙන්නේ. එහෙම තතත්වයට මුහුණ දෙමින් තමයි මේ දේශපාලනය කරන්නේ. අපි ඔබතුමා බොහොම අමාරුවෙන් හදාගත්ත මේ පක්ෂය ප්‍රථමයෙන් ගරු නගරාධිපතිතුමා වෙලා අපි ලොකු කැපකිරිමක් කරලා ලබා ගත්තු දේශපාලන බලය ගිලිහි යන්න දෙන්න ඒපා. ඒ නිසා කරුණාකරලා මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න .මට අඩුම තරමින් සතියකට තුන් දෙනෙක් දෙන්න මම ඒ ප්‍රදේශයේ කාණු ටික ශුද්ධ කර ගන්නම්. ඔබතුමාගෙන් එම ඉල්ලිම කරනවා. නගර සභාව තුල අවුරුද 15 ක දේශපාලනය තුල මෙයට තිබෙන සියලු අත්දැකිම් අරගෙන මේකට විසඳුමක් දෙන්න කියලා ඉල්ලිමක් කරනවා.ඊයේ දවසේ කාණුව ශුද්ධ කරන හැටි බැලුවම මම ඒරංගට කථාකරලා කිව්වා මේ ගැන බලන්න කියලා. තණකොළ කපන එක්කෙනා පැයක් වැඩ කරලා නැහැ ගරු නගරාධිපතිතුමා අඩි ගාන මැනල කියන්න පුලුවන් තණකොළ කපල තියෙන ප්‍රමණය. මිනිස්සු නිකං පඩි ගන්න තමයි බලාගෙන ඉන්නේ දැන් මේක හුරු වෙලා ඉවරයි. තවදුරටත් මෙහෙම සිද්ද වෙන්න දුන්නොත් තමුන්නාන්සෙට අපිට පවක් සිදුවෙයි.ඒම නිසා ඒ ගැන අවධානය යොමු කරලා කටයුතු කරන්න කියල ඉල්ලිම කරනවා.

**03(9) මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමා,මම ඔබතුමාට පෞද්ගලිකවත් කථාකරලාතියෙනවා ඉදිබැද්ද ජුබිලිපාර අවුරුදු 30 කට පසුව දැනට අවුරුදු 3 කට වගේ ප්‍රථම භූගත ජල නල යොදලා කාණු පද්ධතියක් සකස් කරලා ක්‍රිෂාන්ත විජේරත්න ගරු මන්ත්‍රීතුමා සමඟ ඒකතු වෙලා ඒ පාර සම්පූර්ණයෙන්ම කොන්ක්‍රිට් ගල් අල්ලලා තියෙන්නේ. ඉදිබැද්ද ඒඩ්වට් පටුමග ප්‍රදේශයේ තියෙන කාණු වට තමයි මේ කොටස සම්බන්ධ වෙන්නේ. ඒ හංදියේ කොටස කඩලා බටය දැම්මා ප්‍රධාන කාණුවට. ඒ හරිය සම්පූර්ණව දැන් කැඩිලා තියෙන්නේ අලුතින් හදපු පාර ගල් කීපයක් ගැලවිලා ඒම නිසා ප්‍රිමික්ස් ඉතා ස්වල්ප ප්‍රමාණයක් තමයි යන්නේ ඒය පිලිසකර කර දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**03(10) මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මි**

ගරු නගරාධිපතිතුමා, මොරටුමුල්ල අපද්‍රව්‍ය නොගෙන යාම සම්බන්ධයෙන් මා වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ. R.C.විරක්කොඩි මහතා ඉහත ලිපිනයේ සඳහන් වෙළඳ ව්‍යාපාරයේ ඇති අපද්‍රව්‍ය රැගෙන යාමට පැමිනෙන මොරටුව මහ නගර සභාවට අයත් කසල ලොරියේ කසල රැගෙන යාම සඳහා මගෙන් මුදල් අයකරන අතර දැනට මාස 2 ක සිට වෙළඳ සැලේ ඉවතලන අපද්‍රව්‍ය රැගෙන යාම ප්‍රතික්ෂේප කරන බවත් මුදල් නොදෙන නිසා රැගෙන යාමට නොහැකි බව ඔවුන් පවසන බවත් මේ සඳහා මාහට සාධාරණයක් ඉටු කර දෙන ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිමි. ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**03(11) මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මි**

ගරු නගරාධිපතිතුනි, මොරටුමුල්ල ප්‍රදේශයේ කාණු පද්ධති පිරිසිදු කිරිම හැකි ඉක්මනින් ආරම්භ කිරිමට හැකියාවක් ඇත්නම් ඉතාමත් වටිනවා මේ වෙලාවේ ඩෙංගු රෝගය අවධානම බෙහෙවින් තිබෙන නිසා. ඒ නිසා ඒ කටයුතු ආරම්භ කරන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, මොරටුව මහ නගර සභාව තුල මාධ්‍ය ආවරණය ලබා දෙන ලෙසත් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

## 04. **ප්‍රශ්ණ -** නැත

## 05. **යෝජනා -**

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි,මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ 13 (ඌ) යටතේ යොජනාවක් ඉදිරිපත් වෙලා තියෙනවා.එම යෝජනා ඉදිරිපත්කිරිමට අවස්ථාව ලබා දෙනවා.

**05(1)** නගරාධිපති ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා මහා නගර සභා මන්ත්‍රී ජී.සුරංග එන්.අපෝන්සු, එල්.ඔසද හර්ෂණ අබේකෝන්,එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු,එම්.නාලනි ප්‍රනාන්දු,ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු යන මහතුන් විසින් කල් දී ඇති යෝජනාව නගරාධිපති ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

"1997 සිට 2004 ජුනි 30 දක්වා ඉන්ධන දිමනා ලෙස රුපියල් 11,087,504.98 සහ 2000 මාර්තු 01 සිට 2004 ජුනි 30 දක්වා මුද්දර දිමනා ලෙස රුපියල් 734,750.00 මුදලක් මොරටුව මහා නගර සභාවේ අරමුදලින් ලබා ගැනිම යන පදනම යටතේ ඒවකට මොරටුව මහ නගර සභාවේ මහා නගර සභා මන්ත්‍රීවරුන් වශයෙන් කටයුතු කල අප ඇතුලු මහ නගර සභා මන්ත්‍රීවරුන් පිරිසකට

අධිභාර කර ආපසු සභාව වෙත ගෙවීමට කටයුතු කරන ලෙස නාගරික කොමසාරිස් විසින් අංක MMC/LMW/01/01/04/2021 හා 2021.07.14 දිනැති ලිපිය මගින් දන්වා ඇත.

එහෙත් ඒවැනි දීමනාවක් අපි විසින් ඉල්ලා නොසිටි බැවින්ද, ඒවැනි දීමනාවක් ලබා දීමට අදාල නීතිමය විධිවිධාන එම දීමනාව ගෙවීමට පෙර ඊට අදාල රාජකාරි ඉටු කල නිලධාරීන් විසින් සලකාබලා නොමැති බැවින්ද, ඒම දීමනාව අප විසින් පුද්ගලික පරිහරණයට ලබා නොගත් බැවින් හා පොදු මහජන සේවාවන් ඉටු කිරීම සඳහා යෙදවූ බැවින් ද,එම දීමනාව ගෙවීම සම්බන්ධව අධිභාරයට ලක්ව සිටි මොරටුව මහා නගර සභාවේ නියෝජ්‍ය නාගරික කොමසාරිස්,නාගරික ගණකාධිකාරි,නාගරික ලේකම්, අභ්‍යන්තර විගණක යන නිලධාරීන් ඒම අධිභාරය සම්බන්ධව සිදු කල අභියාචනයක් මත අධිභාරයෙන් නිදහස් කර ඇති බැවන් ද, ඒම අධිභාරය ලිපි නිකුත් කිරීමෙන් පසු ඒ සම්බන්ධව මහ නගර සභා ආඥාපනතේ 226 (03) වගන්තිය යටතේ නියමිත කාල සීමාව (දින 14) තුල අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා ඒම අධිභාර සහතිකය අප වෙත භාර දීමෙන් හෝ සම්බන්ධව දැනුවත් කිරීමට කටයුතු නොකිරීම තුලින් ඒම අධිභාර සම්බන්ධව අභියාචනා ඉදිරිපත් කිරීමට අවස්ථාක් නොලැබුන බැවින්ද, මෙම සිදුවීම සම්බන්ධව නැවත විමර්ශනයක් සිදුකර දැනට අධිභාරයට යටත් කර ඇති ඒවකට සිටි මහ නගර සභා මන්ත්‍රිවරුන් ඒම අධිභාර වලින් නිදහස් කිරීමට කටයුතු සලසා දෙන මෙන් යොජනා කර සිටින්නීය.

එම යෝජනාව මහා නගර සභා මන්ත්‍රී ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා විසින් ස්ථිර කරන ලදි.

අංක 05 (1) දරණ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, දැනට සභාවේ ඉන්න මන්ත්‍රිවරු අතරින් ජනතා විමුක්ති පෙරමුණේ කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුමත්, ඒවකට ජනතා විමුක්ති පෙරමුණ සිටි ඒ.ඒච්.සුරේශ් ඉන්දික මන්ත්‍රිතුමාත් මුලසුනේ සිටි මමත්,මහ නගර සභා මන්ත්‍රී මැක්සි ජේ ප්‍රනාන්දු, සුනිල් නන්දසිරි මාසකෝරාල, රවිනාත් ජේ ගුනසේකර, සුරංග ඒන් අපොන්සු ,ගාවින් මත්තෙස් යන මහතුන් ඇතුලු මන්ත්‍රිවරුන් 8 දෙනෙක් දැනට සභාවේ ඉන්න අය ඇතුලත් වෙලා තියෙනවා. මේ අධිභාරයට විශේෂයෙන්ම මන්ත්‍රිවරුන් විශාල ප්‍රමාණයක් තවත් ඉන්නවා. මියගිය මන්ත්‍රිවරුනුත් ඉන්නවා. ඒ නිසා මේ යෝජනාව වැඩිදුර කථා කිරීමකින් තොරව අදාල වෙන්නාවූ කමිටුව මගින් මේ සඳහා වෙන්නාවූ විමර්ෂණය සිදු කිරීම සඳහා මේ අධිභාරයේදී විශේෂයෙන්ම මේ අධිභාරය ලබා ගැනිම සඳහා ඒවකට සභාවත් ඊට අමතරව ඊයේ දිනයේදී තිස්ස කිත්සිරි මන්ත්‍රිතුමා විසින් යොමු කරන ලද ලිපි කිහිපයකුත් මා හට ලැබුනා. ඒවා සියලු දේ සැලකිල්ලට අරගනිමින් නිලධාරීන් අධිභාරයෙන් නිදහස් කලාසේම ගරු මන්ත්‍රිරුන්වත් මේ අධිභාරයෙන් නිදහස් කිරීම සඳහා ඉදිරියට අවශ්‍ය කටයුතු කිරීම සඳහා යොමු කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, නාගරික කොමසාරිස් තුමා අපිට එවලා තිබෙනවා ලිපියක්. මේ මුදල සභාවට ගෙවන්න කියලා ඒ ලිපියට මේ මොහොතේදි අපි මොකක්ද කල යුත්තේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, මේ ලිපියත් ඒක්ක තමයි අපිට ඉදිරියට යන්න තියෙන්නේ ලිපිය ආවේ නැත්නම් කෙලින්ම නඩුවක් ඒනවා. අපිලිපියට අනුව කටයුතු කරලා අපිට පුලුවන් විමර්ෂන නිලධාරියෙකුට යොමු කරලා අධිභාරයක් නම් එයින් අපිට නිදහස් වෙන්න පුලුවන් වෙයි. අපි ඒ අනුව කටයුතු කරමු.

<u>**මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මම හිටපු කොමසාරිස්වරු දෙදෙනකුට කථා කලා ඒතුමන්ලා කියනවා මේක කොහේවත් වෙන්නේ නැති වැඩක්ලු නිලධාරින් ගැලවිලා මන්ත්‍රිවරුන්ට මෙය ඒන්න. ඒ නිසා විශේෂයෙන් මේ ගැන අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

## 06. <u>2021 ජුනි මස ස්ථාවර කමිටු වාර්තා සලකා බැලීම.</u>

### 06(1) 2021.07.02 දින පැවැති මුදල් පිලිබද ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ සලකා බැලීම.

<u>**මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මුදල් කමිටුවට අදාලව 2(1) 2(35) දක්වා අපේ විරෝධය. අංක 3 කැබ් රථ මිලදි ගැනිම සම්බන්ධයෙන් අපි විරුද්ධයි. මෙවැනි බරපතල තත්වයක් තිබියදි අධික වියදමක් දරමින් කැබ් රථ මිලදි ගැනිම සම්බන්ධයෙන් අපිට ඒකගවෙන්න බැහැ. සභාවේ ප්‍රමුඛතාවයන් අනුව මෙවැනි තීන්දු ගතයුතුයි කියන තැන අප ඉන්නවා. 9(1),9(2), විරුද්ධ වෙනවා. පැහැදිලි කිරිමක් බලාපොරොත්තු වෙනවා 20 කරුන සම්බන්ධව. ඉතාම හොඳ අත්‍යාවශ්‍ය කාරණයක් අපි සභාව මැදිහත් වෙලා කරන්නේ කොවිඩ් රෝගින්ගේ දේහයන් සභාව මැදිහත් වෙලා කරන කාරණය. ගිය සභාවෙදි අපි තින්දුව ගත්තේ 2021.06.30 වන දින නමුත් 2021.05.20 ඔබතුමාගේ උපදෙස් පරිදි බිල් ප්‍රමාණයක් ඉදිරිපත් වෙනවා ඊට කලින්. දැනගන්න කැමතියි ඊට කලිනුත් මේ දේ සිදුවුනාද කියලා.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රිතුමා, මැයි මාසේ මහ සභාවේදි මේ යෝජනාව ඉදිරිපත් වුනා. මුලින්ම අපි අඩක් කරමු කියලා පසුව මම කිව්වා අපි සම්පූර්ණම කරමු කියලා මහ සභාවේදි සියලුම ගරු මන්ත්‍රිවරු උපරිමය රු.15000/- දක්වා ඉක්මව නොයන ආකාරයට කටයුතු කරමු කියලා. පානදුර මල් ශාලාව සමඟ සාකච්ඡාවෙදි ඒ අය රු.12000/- ක් අවසාන වශයෙන් ඉල්ලුවා. මැයි මාසේ සභා වාර්තාවේ සඳහන් වෙලා තියෙනවා රු15000/- යටත්ව ක්‍රියාත්මක කලා. පසුව සඳුන් මල් ශාලාවෙන් රු.10000/- ට කරන්නම් කියලා කිව්වා.සභාව ඒකමතිකව සම්මත කලා. පසුව අපි මුදල් කමිටුවට යොමු කරලා අනුමැතිය ගත්තා. ඒ අනුව තමයි මේ කටයුතු කලේ.

<u>**මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා,ඊලඟට අංක 25,28 විරුද්ධයි.අදාහන කටයුතු වලට අදාලව පුංචි ඉල්ලිමක් තියෙනවා බේසර ගරු මන්ත්‍රිතුමාත් මෙතන ඉන්න නිසා ඔබතුමාලා විශාල මැදිහත්විමක් කරලා රාවතාවත්ත ආදාහනාගාරය ප්‍රතිසංස්කරණ කටයුත්තක් කලා.කොවිඩ් මරණයක් වෙලා මම ඒ ස්ථානයට ගියා. ඒතන සේවකයෝ සඳහන් කලා ඇතුලේ දුම කාණ්ඩු විමක් වෙනවා කියලා.විශේෂයන්ම මේ කොවිඩ් තත්වය ඇතුලේ දුම බරපතල තත්වයක් තිබෙන නිසා ඒයට කඩිනමින් විසදුමක් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. ඒවගේම ඒ අයට ලබාදෙන නිලඇදුම ප්‍රමිතිය මදි කියලා තමයි කියන්නේ.මම විවේචනයක් කරනවා නොවෙයි.ඒ සඳහා අවධානය ලක් කරන්න කියන ඉල්ලිම කරනවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - තිසර රසාංජන මෙන්ඩිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා,මුදල් වාර්තාවේ 3,9(1) අංක 25,28 විරුද්ධයි. 12ට පැහැදිලි කිරිමක් බලාපොරොත්තු වෙනවා ආවරණ අනුමැතියට යටත්ව අනුමැතිය දුන්නද කියලා.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා,ආවරණ අනුමැතිය යටතේ තමයි හදිසි වැඩ කරන්නේ.

-සභා ඝෝෂ-

**මහ නගර සභා මන්ත්‍රී - අනුරසිර ජේ ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමා, ඒක්සත් ජාතික පක්ෂය අපි මුදල් කමිටුවේ අංක 9, 25,28 විරුද්ධයි.අනිත් කරුණුවලට පක්ෂයි.

2021.07.02 මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.උජිත් ක්‍රිශාන්ත කල්දේරා මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |

2021.07.02 මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 03,අංක 09 (1) 09 (2),අංක 25,අංක 28 යන කරුණු වලට විරුද්ධවත් අනෙකුත් සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් ඡන්දය ප්‍රකාශ කරන ලදි

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |

| | | | |
|---|---|---|---|
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |

2021.07.02 මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 09,අංක 25,අංක 28 යන කරුණු වලට විරුද්ධවත් අනෙකුත් සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් ඡන්දය ප්‍රකාශ කරන ලදි

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |

2021.07.02 මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02 (1) සිට 02 (35) දක්වා අංක 03, අංක 09 (1),09 (2) යන කරුණු වලට විරුද්ධවත් අනෙකුත් සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් ඡන්දය ප්‍රකාශ කරන ලදි

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

2021.07.02 මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(මේ අවස්ථාවේ දී මහා නගර සභා මන්ත්‍රී යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා,කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා සුනිල් නන්දසිරි මාසකෝරාල, රවිනාත් ජයශ්‍රී ගුණසේකර, යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා, ආර්.එම්.ඒ.දෝන දිලාශිනී යන මහත්ම මහත්මීන් සභා ගැබෙහි නොසිටියහ.)

## 07. <u>ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව -</u>

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි,2021.07.02 මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2021 මැයි මාසයට අදාළ මුල්‍යා වාර්තාව ඇමුණුම - 01 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

## 08. <u>පුද්ගලික ස්වභාවයේ කරුණු</u> -

### 08(1) <u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා,ඉදිබැද්ද මොරටුව ලංගම බස් රථ දෙකක් ධාවනය වුනා. දැන් මාස ගණනාවක් තිස්සේ බස් රථ ඒකක් වත් නැහැ.ලංගම බස් රථය වැඩ කරනකොට රාත්‍රී 8-9 වනතුරු වැඩ කලා.පෞද්ගලික බස් රථ වැඩ කලත් රාත්‍රී 8 න් පසුව නැහැ. මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරලා බස් රථ ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**08(2)** **මහ නගර සභා මන්ත්‍රී - ඒම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමා, කොවිඩ් වසංගතයත් එක්කම ඩෙංගු රෝගය ව්‍යාප්තවෙලා තියෙනවා. ඉදිබැද්ද සේවා පටුමග නිවාස 2 රෝගීන් හතර දෙනෙක් වාර්තා වෙලා තිබෙනවා. ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා මේ සඳහා අවශ්‍ය කටයුතු කරදෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**08(3)** **මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමා, ප්‍රථමයෙන්ම අලුතින් පත්වී තිබෙන ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂකතුමාට සුභ පතනවා.අලුත් ඉංජිනේරු තුමා අපි එකතු වෙලා වැඩ කරමු. මේ මාසේ මන්ත්‍රී දීමනාව සුදර්ශනි ප්‍රනාන්දු මන්ත්‍රීතුමීගේ ලැබිලා නැහැ. පදනම් කරගෙන තිබෙන්නේ ගිය අයවැය සහ ඡන්දය දීමේදී ඒතුමිය අත්සන් කරපු නිසාත් එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ඒතුමියට විනය පරික්ෂණයක් නැහැ ගරු නගරාධිපතිතුමනි. ඒම නිසා ඒම දීමනාව ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. අවශ්‍ය නම් මහ ලේකම්තුමාගෙන් ලිපියක් ලබා දෙන්න පුලුවන්.

**මහ නගර සභා මන්ත්‍රී - ඒම්.සුදර්ශනි ප්‍රියන්ති ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමා, විපක්ෂනායක තුමාගේ කථාව සිරිකොත අපේ පක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉදිරියේත් මම ප්‍රකාශය කලා. විපක්ෂනායකගේ මේ ලියුම අත්සන් නොකිරිම සම්බන්ධයෙන් මම ඒක කරන්නේ නැහැ කියන ඒක අපේ පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉදිරියෙත් මම ප්‍රකාශය ඉදිරිපත් කලා.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමිය, කියන ඒක තව කවුරුහරි කිවුවත් මට පිලිගන්න වෙනවානේ තව ඉස්සරහට ලිහිනි මන්ත්‍රීතුමියටත් ඕක කියන්නත් පුලුවන්. ඒක ප්‍රශ්ණයක් නැහැ. අනුරසිරි ගරු මන්ත්‍රීතුමා ඔබතුමත් සමහර විට දන්නේ නැතුව ඇති. මේවගේම සිද්ධියක් වෙලා වැරදි දීමනාවක් දීලා මටත් ගෙවන්න වුනා ඒක්ලක්ෂ හැට ගානක්. ඒතනදි නොගෙවීම තුල දැනට එය නීතිමය කටයුත්තක් වෙලා ඔබතුමන්ලාගේ අතුල පිරිස් සහ ශාන්ත පොන්සේකා හිටපු මන්ත්‍රීවරුන්ට දෙපලට. බැරිවෙලාවත් මේණය මුදල ගත්තු අය පක්ෂයෙන් නෙරපලා මන්ත්‍රීධුර අහෝසි වුනොත් ඒක ඔබලා අරගෙන අපිට දඩ කන්න බැහැනේ. ඒක නිසා අපිට පක්ෂයෙන් ඒවනවානම් මෙගොල්ලෝ මේකට සම්බන්ධ නැහැ කියලා අපිට ගැටලුවක් නැහැ. රටේ ඉහලම අධිකරණයෙන් නියෝගයක් දීලා තියෙනවා ලේකම් තුමාට නිශ්ප්‍රභා කරලා තියෙනවා. සමහර ඒවා විභාග නොකරම ප්‍රතික්ෂේප කරලා තියෙනවා.ඒච්චර බලයක් යෙදූ නඩු තීන්දුවකට අපට පොඩ්ඩක්වත් ඒ පිලිබඳව අහක බලාගෙනක ඉන්න පුලුවන් කමක් නැහැ. ඒ ඇරෙන්න අපිට කිසි ගැටලුවක් නැහැ ඔබතුමියගේ ලේකම් රංග බණ්ඩාර මැතිතුමා ඒවනවා නම් අපිට ප්‍රශ්ණයක් නැහැ.

**08(4)** **මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා**

ගරු නගරාධිපතිතුමා, ඒ සම්බන්ධයෙන්ම අපිට ඒ පක්ෂයත් ඒක්ක සංධානගත වෙලා තියෙන්නේ හෙල උරුමය විදියට. පෙරමුණක් විදියට. ඒනිසා මහින්ද රාජපක්ෂ මැතිතුමත් ඒක්කත් ඒහෙමයි මෙතනත් ඒහෙමයි ඒනිසා අපිට කිසිදු පක්ෂ මහ ලේකම්වරයෙක් ඒක්ක බැදිමක් නැහැ අපේ විනය පරික්ෂනයක් කරනවා නම් කරන්නේ මහ ලේකම් වරයා සහ මධ්‍යම කාරක සභාව ඒම

නිසා ඒහෙම තියෙද්දිත් මගේ කපා හැරිම සම්බන්ධයෙන් විරෝධයක් තියෙනවා. කිසිම විනය පරික්ෂණයක් නැත්නම්.

-සභා ඝෝෂ-

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු ඔබතුමා , ඒක අපට ඒවන්න ඕන. ඔබතුමා මාසික දීමනා කොවිඩ් වලට අපිට ලියලා දුන්නා ඒ වගේ කෙනෙක්. අපි හිතාමතාම නොදි ඉන්න ඒකක් නොවෙයි. උත්තරිතර පාර්ලිමේන්තුවේ 98 දෙනෙක් විපක්ෂයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් පත්වෙලා ඇවිල්ලා 16 දෙනෙකුගේ නායකත්වයෙන් යුතු වෙන්නාවූ ටි ඒන් ඒකට දුන්නා විපක්ෂනායක කම. හේතුව සංධානගත වුනාම කණ්ඩායමේ ලේකම් පිලිගත්තා ආණ්ඩු පක්ෂයට ඒකතුවිම තුල විපක්ෂනායක විදියට මහින්ද රාජපක්ෂ මැතිතුමා පිළිගන්න බැහැ අපි ආණ්ඩුව ඒකතුවෙලා තියෙනවා ඒක්සත් ජාතික පක්ෂයත් ඒක්ක. ඒක නිසා දැන් මේගොල්ලෝ ආණ්ඩුවේ කොටස් කාරයෝ කොහොම උනත් පිලිගන්නේ නැහැ මහින්ද රාජපක්ෂ මැතිතුමා විපක්ෂයේ කියලා. මහලේකම්ගේ නියමය පරිදි තමයි අපිට විපක්ෂනායක කම නොදි 16 කින් යුක්ත සම්බන්ධන් මැතිතුමාට දුන්නේ. ඔබතුමා දැන් ඉන්නේ මැතිවරණ කොමසාරිස් පත් කරපු මන්ත්‍රිවරයෙක් විදියට ඒක්සත් ජාතික පක්ෂයත් මහලේකම් මිසක් ඔබතුමාගේ මහ ලේකම් නොවෙයි. ඒනිසා ඒතුමා කියන දේ හැර මට සභාවේ වෙන දෙයක් පිලිගන්න බැහැ.

**මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා**

ගරු නගරාධිපතිතුමා, ඔය දීමනාව සම්බන්ධයෙන් ප්‍රශ්ණයක් නොවෙයි. මම පලවෙනි වැටුපෙන් දුප්පත් මනුෂ්‍යයෙකුට නිවසක් හදලා දුන්න කෙනේ.

-සභා ඝෝෂ-

ගරු නගරාධිපතිතුමා,අපි කොවිඩ් ප්‍රශ්ණය සම්බන්ධයෙන් කථා කරනවා. ඒ වගේම ඩෙල්ටා ප්‍රබේදයක් තියෙන කාලෙක නගර සභාවට ඇතුල් වන ස්ථානයේ වතුර නැහැ. විෂබිජ නාශක නැහැ ඒම නිසා මේවා විධිමත් කරන්න කියන ඉල්ලිම කරනවා.

**08(5)** **මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**

ගරු නගරාධිපතිතුමා, අපිත් සුභ පතනවා ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක යසන්ත මහත්මයාට. ඒතුමාගෙන් ඉල්ලිමක් කරනවා අපේ කාණු කණ්ඩායම විශාල මහන්සියක් දරනවා මේ කටයුතු කරද්දි ඊයේ සොයිසාපුර තමයි කාණු කණ්ඩායම වැඩ කලේ ඉතාම සංවේදි කරුනක් ඒ සහෝදර කණ්ඩායමට ග්ලවුස් නැහැ. බූට්ස් නැහැ.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රිතුමා ,ඒගොල්ලෝ ඒවා පාවිච්චි කරන්නේ නැහැ. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක තුමා ඒ අයට ඒවා පලඳින්න කියන්න.

**08(6)** **මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂිනි වික්‍රමසිංහ මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, දැන් නැවත ඩෙංගු රෝගය මතුවෙමින් තියෙනවා. දැන් ධූමායනය සිදු කරන්නේ නැත්තේ ඇයි කියන කාරණය සම්බන්ධයෙන්.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය , ඔබතුමියලම ඕක අහන ඒක වැදගත් ඒවගේම ප්‍රායෝගිකයි. මාධ්‍යවේදින් සිටියානම් අද දවසේ ඕක තමයි මම හිතන්නේ වැදගත්ම කාරණය. හේතුව තමයි බෝ වෙන රෝග සම්බන්ධයෙන් වගකියන්නේ දැනට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල දෙක පමණයි. අපිට තියෙන්නේ ඒ සඳහා උදව් වෙමින් මැඩ පැවැත්වීම සඳහා වෙන්නාවූ කාරණය කිරීමට විතරයි. ඩෙංගු රෝගියෙක් දැනගත්තාම ඒ පනිවිඩය ලැබෙන්නේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට විතරයි. දැන් මාස 3 කින් පමණ කැඳවීමක් කලාට ඒන්නෙත් නැති තත්වයට පත්වෙලා ඔවුන් කොවිඩ් ඒක්ක විතරක් ඉන්නවා ඩෙංගුත් ඒක්ක ඉන්නේ නැහැ. අපිට පුලුවන් කමක් නැහැ වෛද්‍යවරු අපිට දෙන තොරතුරු ආශයෙන් ගිහිල්ලා දැනට ලංකාවේම වක්‍රලේඛ නිකුත් කරලා තියෙනවා ආසදිතයෙක් ඉන්න තැනකට විතරයි දුම්මානය කරන්න පුලුවන් වෙලා තියෙන්නේ. ඒ තොරතුරු දෙන්න වත් වෛද්‍යවරු ඒන්නෙත් නැහැ PHI වරු ඒන්නේත් නැහැ අපේ අයට ඒ වාර්තාව ඒන්නෙත් නැහැ. ඔවුන්ගෙන් වාර්තාව අරගෙන්න කරන්න තියෙන්නේ ලබන සිකුරාදා වෙනකොට ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක තුමනි ඔබතුමා ඔය සංනිවේදන කටයුත්ත කරන්න ඔබතුමා රෝහල් සමඟ කථා කර ල හෝ තොරතුරු ලබා ගැනීමේ මොකක් හරි ක්‍රමවේදයක් හදාගෙන මේවට පිලිතුරු දෙන්න මොකද කාගෙන්වත් ලැබෙන්නේ නැහැ කියලා අපිට ඉන්න පුලුවන් කමක් නැහැ. කවුරුත් දුම ගහන්නේ නැහැ කියලා අපිට නොගහ ඉන්න පුලුවන් කමක් නැහැ.ජනතාව වෙනුවෙන් වැඩ කරන්න ඕන නිසා කාගෙන් තොරතුරු ලැබෙන්නේ නැති වුනත් තොරතුරු ලබා ගැනීමේ වැඩ සටහනක් ඔබතුමා දියත් කරන්න. ගරු මන්ත්‍රීතුමිය මේක තමයි මට දෙන්න පුළුවන් උත්තරය.

**08(7)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂිනී වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි , කඩුවෙල මහ නගර සභාවේ අපේ මන්ත්‍රීවරුත් මැදිහත් වෙලා ඒක ග්‍රාමසේවා වසමක් පුරාවටම දුම්මානය සුදු කලා. ඒකත් නගර සභාවක්නේ. ඒකට ඒක නීතියක් මේකට ඒක නිතියක් වෙන්නත් විදියක් නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, දන්නේ නැති වුනාට ඒකට ඒක නිතියක් මේකට ඒක නීතියක් නොවෙයි ඒක ඩොක්ටර් කෙනෙක් කැමති ඒකක් මේ ඩොක්ටර් කැමති නැහැ.මේ ඩෙක්ටර් කැමති ඒකක් අර ඩොක්ටර් කැමති නැහැ මේක ඇතුලෙම නීති ගොඩක්. මම ඒක ඒක නිදසුන් ගන්න උත් සහ ගන්නේ නැහැ. මේක ඇතුලෙන ඕන තරම් නිදසුන් තියෙනවා.

**08(8)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂිනී වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි , මම කලිනුත් ඉදිරිපත් කලා බොරුපන රෙක්නිස් ආයතනය සතියේ සෑම සෙනසුරාදා දිනකම දුම්මානය කරනවා. අධික සැර දුමක් තමයි ගහන්නේ. ඒතකොට ඒ වත්තේ සිටින මදුරුවෝ පිටට ඒන නිසා ඒ ගමට ලොකු ප්‍රශ්ණයක් වෙලා තියෙන්නේ. මේ පැත්ත ධුමායනය කරන්නේ නැහැ. ආයතන තුල ධුමායනය කරනවා ඒ මදුරුවෝ ඒලියට ඒන නිසා ජනතාවට තර්ජනයක් වෙලා තියෙනවා. ඒ නිසා ඔබතුමා ඒ පිලිබඳව සැලකිල්ලක් දක්වන්න කියලා ඉල්ලා සිටිනවා.

**08(9)** <u>මහ නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවින්ද්‍ර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි ,වසර 50 ක පමණ අතීතයක් තියෙන මාර්ගයක් සම්බන්ධ සුවිශේෂී සිදුවීමක් පසුගිය 10 වනිදා කුඩුවාමුල්ල ප්‍රදේශයේදි සිදුවුනා ඇත්තටම ප්‍රදේශවාසින්ගේ ලොකු ඉල්ලීමක් තිබුනා කාලෙක සිට කෙසේ වෙතත් ඔබතුමාගේ මැදිහත්වීමත් මා ලබා දුන් මැදිහත් වීමත් මත කුඩුවාමුල්ල පලවෙනි පටුමගේ සිට සුධර්මාරාම පාර දක්වා හල්ලන කුඹුර හරහා

පුද්ගලික ඉඩම් දෙකකින් නදී හේමචන්ද්‍ර සහා පියුමි විජේතුංග යන දෙපලගෙන් පර්චස් 40 ක පමණවන ඉඩම් පරිත්‍යාගයකින් මොරටුව මහ නගර සභාවේ මාර්ගයක් ආරම්භ කිරිමට අපට හැකියාව ලැබුනා. ඒ වෙනුවෙන් ඔබතුමාගේ මැදිහත් වීමත් අපේ ගරු නිලධාරින්ගේ මැදිහත් විමටත් කුඩුවාමුල්ල ප්‍රදේශ වාසින් සියලු දෙනාගේ ස්තුතිය මේ අවස්ථාවේදි පුදකර සිටිනවා.

**08(10)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි , මන්ත්‍රිවරුන්ගේ දීමනාව කැපිම සම්බන්ධයෙන් ඔබතුමාගේ පදනම තමයි විනය පරික්ෂණයක් සඳහා යොමු කිරිම තුල මේ මන්ත්‍රිධුරය යම්කිසි අවස්ථාවක අවධානමකට ලක් කිරිම කියන ඒක. ඒහෙම නම් මම අහන්න කැමතියි මේක යම් කිසි පිරිසකට පමණක්ද සීමා වෙන්නේ කියන ඒක. ඒසේ නම් විනය පරික්ෂණයකට කැඳවලා තියෙන ක්‍රිෂනි ප්‍රනානදු මහත්මියට දීමනාව ලබා දිලා තියෙනවා. ඒතුමියත් මේ විනය පරික්ෂණයට ලක් වුන මන්ත්‍රිවරියක්.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමිය ණය මුදල ගත්තාද ?

<u>මහ නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ණය මුදල අරගෙන තියෙන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමිය, ඒහෙමනම් වැරදිමක් සිදු වෙලා තියෙන්නේ. නිවැරදි කිරිම විතරයි කරන්න තියෙන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ ණය ගෙවිමේදි අපි අත්සන් කරලා තියෙනවා මාසිකව අඩු කර ගැනිමක් සිදු කරන්න කියන ඒක. මන්ත්‍රිධරයෙන් අපිව නෙරපලා නැහැ. මේ දීමනාව ගෙවිමම අවිධිමත් ක්‍රියාවක් කියලා කියන්නේ. සීමිත මන්ත්‍රිවරුන්ට පමණක් නොවෙයි.සියලුම මන්ත්‍රිවරුන් මේකට ලක් වෙන්න ඕන. මේක පලිගැනිමක් කියලා හිතන්න පුලුවන්.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා,ඔබතුමාට හිතන්න පුලුවන්

-සභා සෝෂ-

**08(11)** <u>මහ නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපි කෝවිඩ් වසංගතයට අවධානය යොමු කරනවා වගේම ඩෙංගු රෝගය සඳහාද අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඩෙංගු රෝගය ව්‍යාප්ත කිරිම වලක්වා ගැනිම සඳහා පරිසරය පිරිසිදු කරිම අනිවාර්යයි. පරිසරය පිරිසිදුව තබා ගැනිම සඳහා මහජන නියෝජිතවරියන් වශයෙන් අපි කරන උත්සහායට සහයෝගයක් ලැබෙන බවක් නම් පේන්න නැහැ. මගේ නිවස ඉදිරිපිට දැන් මාස 6 කට වැඩියේ ගල්කැලි තිබෙනවා.ඒ උඩට ගොඩක් ජනතාව කුණු ගෙනත් දාලා අපවිත්‍ර වෙලා තියෙනවා. ඔබතුමාට, කොමසාරිස් තුමාට දැනුවත් කරල තියෙනවා. මේ වෙනකම් මෙය ඉවත් කිරිමට මට සහයෝගය ලැබිලා නැහැ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය මම ඔබතුමියට උපදෙස් දෙන්න යනවා නොවෙයි. කවුරු හරි ගෙවල් කඩලා කැලි ගෙනත් දානකොට දාන අයට දාන්න ඒපා කියලා මුලින්ම කියන්න ඕන. දාලා ශුද්ධ කරනවා කියන ඒකට අපි අනුබල දෙකක් දිලා. දානත් දිලා ශුද්ද කරන්නත් දිලා. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා මේ ගැන සොයා බලන්න.

**08(12)** **<u>මහ නගර සභා මන්ත්‍රී - අනුරසිරි ජේ සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේ වෙනකොට පාරවල් අලුත්වැඩියාවන් කරන්නේ නැද්ද?

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේ මොහොත වෙනකොට නගර සභාවේ සේවක සංඛ්‍යාව දැන් තිබෙන චක්‍රලේඛනයත් ඒක්ක වැඩ කරන්න ගිහිල්ලා මේ තරමින් හරි සෞඛ්‍ය කම්කරුවෝ ගෙන්නගෙන තියෙන්නේ ඔවුන්ට දෙන යම් දෙයක් ගැනිම සඳහා වැඩට ඒනවා. අපි ඔවුන් ඒක්ක ගන්දෙනු කරන විදිය නිසා මේ වැඩට ඒනවා ඇරෙන්න අද මේ වෙනකොට වැඩට ඒන්න කියලා තියේනේ දෙදෙනටයි. සතියකට දෙපාරයි වැඩ කරන්න කියලා තියෙන්නේ. ලොකු ප්‍රශ්නයක් තියෙන්නේ සතියට දෙපාරක් ඒන අය හැමදාම වැඩ හැමදාම වැඩට ඒන්න ඕන අය සතියට දෙපාරයි ඒන්නේ. කම්කරුවන්ට තමයි වැලදෙන රෝගයක් වැලදෙන්න ඕන. මේක පටලැවිල්ලක් වෙලා තියෙන්නේ. මේ අමාරුකම් උඩ තමයි සියලුම දේ කරන්නේ. අද දිනයේදි තමයි මාස ගනනාවකට පස්සේ පූර්ව මිශ්‍ර යොදලා පාරවල් හදන්න ගත්තේ. ඔබතුමාගේ ඔය පාරවල් ටික සංවිධායක තුමත් ඒක්ක ඒකතු වෙලා කිලෝ මීටරයට වැඩි පාරවල් කාපට් කිරිමේ වැඩසටහනක් තියෙනවා ඊට අඩු ඒවා කරන්න බැහැ. ගරු මහා මාර්ග අමාත්‍යතුමාගේ නිර්දේශයන් අනුව කල්දමුල්ල සියලුම පාරවල් අපි කාපට් කරනවා.

**08(13)** **<u>මහ නගර සභා මන්ත්‍රී - පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මට ස්තුතියක් වගේම විශේෂ ඉල්ලිමක් කරන්න තියෙනවා. ලුනාව කලපුව සහ මෝය සම්බන්ධව. සතියකට දෙවරක් වගේ මෝය කැපිම සිදු කරන්න වෙනවා. මම විශේෂ ස්තුතිය පුද කර සිටිනවා දමින්ද රියදුරු මහතාට පසුගිය බදාදා සවස 3.00 ට පටන් ගත්ත මෝය කැපිම රාත්‍රි 9.30 වෙනතුරු මෝය කපන්න සිදුවුනා .ලොකු අවදානමක් අරගෙන තමයි ඒ මෝය කැපිම සිදුකලේ. රාත්‍රි කාලයේ මුහුදේ ඇති වුන ස්වභාවයත් ඒක්ක පැය 2-3 කට පස්සේ මෝය ආපසු වැහිලා ගියා. ඊට පසු දිනත් කපන්න සිදු වුනා. ඒ සම්බන්ධව ඔබතුමාටත් රියදුරු දමින්ද මහතාටත්, ජයරත්න මහතාටත් සියලුම දෙනාටම ස්තුතිය පුද කරනවා. ඔවුන්ගෙන් මතුවුන කාරණයක් තමයි JCB යන්ත්‍රය ලුනාව මෝයට ගේන්න අගුලාන පොලිස් ස්ථානය තෙක් ගීහිල්ලා මුහු දු බඩ මාර්ගයෙන් තමයි ඒන්නේ. ඒ මුහුදු බඩ මාර්ගය යම් යම් ඉදිකිරිම් කරලා තියෙනවා මාර්ගයට අවහිර වන ලෙස මම කර්මාන්ත අංශයට ඉල්ලිමක් කලා මෙය නිවැරදි කරලා දෙන්න කියලා නමුත් ඒය සිදු වෙලා නැහැ. ඒ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරලා කටයුතු කරන්න ඉල්ලිම කරනවා. ඒවගේම මෝය අසල විශාල වැලි පරයක් තැන්පත් වෙලා තියෙනවා. ඉදිරියේදි වැසි කාලයත් ඒක්කම ජලය වැඩි වුනාම මෝය කැපිම දවසින් දෙකෙන් කරන්න සිදු වෙනවා. ඒ සම්බන්ධව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ කථා කරලා වැලි පරය ඉවත් කිරිම් කටයුතු සිදු කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි,මම දුරකථනයෙන් සම්බන්ධ වුන වෙලාවේ ඔබතුමා මාව දැනුවත් කලා ලුනාව ඇවිදින මංතිරුවේ මේ වෙනකොට විදුලිය නොමැති නිසා අසිරුතාවයට පත් වෙලා තියෙනවා. ඔබතුමා සංවර්ධන කමිටුවේදි ප්‍රකාශ කල විදියට සොරුන් විසින් ඒ වයර් කපාගෙන ගිය තත්වය මෙය නැවතත් යථා තත්වයට පත් කර ජනතාවගේ අවශ්‍යතාවය ඉටු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**08(13)** **<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.කුමාර රාජරත්න මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, වර්තමාන ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා හැටියට යසන්ත මහතා පත්වෙලා තියෙනවා. කොරළවැල්ල මගේවසම තුල පහුගිය කාල වල අපිත් සමඟ කටයුතු කරා. බොහෝ අවස්ථාවල රජයේ නිලධාරින් දුරකථනයට වත් ඇහුම්කන් දෙන්නේ නැහැ. තිබෙන කාර්්යබහුලත්වය නිසා වෙන්නට ඇති. නමුත් අපිදැක්කා වසංගත කාලය තුල ඒතුමා සුවිශාල කැපකිරිමක් කරමින් රාත්‍රී 11-12 ට දුරකථානයට කථා නොකරත් පසු දින අරගෙන මොකක්ද ඔබතුමාට වෙන්න ඕන කියලා ලොකු සේවාවක් කලා. ඒතුමාගේ අත්දැකිම් ඒක්ක ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක විදියට මොරටුව ජනතාවට තවත් හොඳින් ඒතුමාගේ වැඩ කටයුතු කරන්න ලැබේවා කියා මා සුභාෂිංශන පතනවා.

09. **<u>වෙනත් කරුණු</u>** - නැත.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලේ/ ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2021.07.20 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය.